# නැගෙනහිර පිබිදීම සහ "අපි වවමු - රට නගමු" වැඩසටහන

අතිගරු ජනපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගේ සංකල්පයකට අනුව කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන් ආරම්භ වූ **"අපි වවමු-රට නගමු"** වැඩසටහන යටතේ දේශීය කෘෂි නිෂ්පාදන දිරි ගැන්වීමේ මෙහෙයුම අම්පාර දිස්ත්‍රික්කයේ ද සාර්ථක ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ සඳහා විශාල සහයෝගයක් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ පී.එම්.එන්. දයාරත්න මැතිතුමා හා ඔහුගේ ක්ෂේත්‍ර නිලධාරීන් ගෙන් ලැබෙන බව ක්ෂේත්‍රයේ විමර්ශන කටයුතු වල දී ගොවීන්ගේ අදහස විය.

මෙහි දී, විශේෂයෙන්ම කරුණු කිහිපයක් යටතේ මෙම වැඩසටහන දිරිගැන්වීම සිදු වෙමින් පවතී. ඒවා නම්,

* කාබනික පොහොර භාවිතය වැඩි දියුණු කිරීම.
* ගුණාත්මක සහල් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
* බඩඉරිඟු නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
* මිරිස් වගාව හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
* ගෙවතු වගාව ඉහළ නැංවීම.

## 01. කාබනික පොහොර භාවිතය

මේ සඳහා කන්නය ආරම්භයට පෙර සිටම නියෝජ්‍ය කෘෂිකර්ම කාර්යාලය මඟින් ක්ෂේත්‍ර නිලධාරීන් හරහා ගොවි මහතුන් වැඩි වැඩියෙන් දැනුවත් කිරීම සිදු කර ඇත. ඒ සඳහා අවශ්‍ය ඉලක්ක ද ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලබා දී ඇති අතර පිදුරු, දහයියා, ගොම හා කොම්පෝස්ට් භාවිතය තවදුරටත් වැඩි කිරීමට කුඩා කණ්ඩායම් තෝරා ගෙන දැනුවත් කිරීම සිදු කෙරෙමින් පවතී.

එම දිරිගැන්වීම අනුව මෙවර කාබනික පොහොර නිෂ්පාදනය සඳහා පිදුරු මෙට්‍රික් ටොන් 43,500ක් භාවිතා කර ඇති අතර එය පෙර කන්නට වඩා සිව් ගුණයකින් වැඩිවීමකි. එසේම, දහයියා මෙට්‍රික් ටොන් 1,850ක් හා ගොම මෙට්‍රික් ටොන් 600 ක් අම්පාර දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින් කුඹුරුවලට හා අතිරේක භෝග වගාවලට භාවිතා කර ඇත. තව ද, කොම්පෝස්ට් මෙට්‍රික් ටොන් 350ක් පමණ විශේෂයෙන්ම එළවළු හා පලතුරු වගාවේ දී මෙම වැඩසටහන යටතේ භාවිතා කර ඇති බැව් ක්ෂේත්‍ර සංචාරයන්හි දී පැහැදිළිව නිරීක්ෂණය කළ හැකිය. එසේම, අන් කවර දිනටත් වඩා රසායනික පොහොර භාවිතය අඩු වී ඇති බව පෙනේ.

අස්වැන්න හා වගා බිම් ප්‍රමාණයේ ද සීඝ්‍ර වර්ධනයක් සිදු වී තිබේ. ඒ සඳහා අත්හරින ලද හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නිසා වගා නො කරන ලද ඉඩම් ද, වගා කිරීම ඇතැම් ගොවි මහතුන් විසින් සිදු කොට ඇත. මෙසේ වගා බිම් ප්‍රමාණය වැඩිවීම සඳහා එළවළු හා පලතුරු වල මිල වැඩිවීම හේතු වන බව ගොවි මහතුන්ගේ අදහසයි. මෙම වැඩසටහන දිරි ගන්වමින් ඉදිරියට ගෙන ගිය හොත් රටට අවශ්‍ය නිෂ්පාදන රට තුළම නිෂ්පාදනය කර ගත හැකි වනු නො අනුමානය.

## 02. ගුණාත්මක සහල් නිෂ්පාදනය

ගුණාත්මක සහල් නිෂ්පාදනය කිරීම යටතේ නව සහල් ගම්මාන 4ක් පරගහකැලේ, කොටවෙහෙර, වාවින්න හා නාමල්තලාව වැනි ප්‍රදේශ වල ආරම්භ කොට ඇති අතර ඉදිරි වෙළඳ ගිවිසුම් 9 ක් ද ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ සඳහා කුඩා කණ්ඩායම් වලට සහල් මෝල් හා පිටි මෝල් ලබා දී තිබේ. වී තැම්බුම්

භාජන ලබාදීම මගින් සහල් නිෂ්පාදනය වැඩි කිරීම ද දිරිමත් කොට ඇත.

අම්පාර ප්‍රදේශයේ මෙම වැඩසටහන යටතේ සහල් අලෙවිසැල් 12ක් ආරම්භ කර ඇති අතර එය 20 දක්වා වැඩි කිරීමට කටයුතු යොද ගෙන යන බව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ **පී.එම්.එන්. දයාරත්න** මහතා පවසයි.

එසේම, සහල් නාමකරණය කෙරෙහි ද අවධානය යොමු කරමින් පවතී. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් සහය ලබා ගෙන ඇත.

## 03. බඩඉරිඟු වගාව

**'අපි වවමු-රට නගමු'** වැඩසටහන යටතේ පිබිදීමත් සමඟ බඩඉරිඟු වගා කිරීම සඳහා ද ගොවීන් වැඩි උනන්දුවක් දක්වන බව ක්ෂේත්‍රයේ ලද අත්දැකීම් වලින් පෙනී යයි. ඉහළ ඉල්ලුම හා සාධාරණ නිෂ්පාදන මිලක් ලැබීම ද මෙයට තවත් හේතුවක් බව ද ගොවීහු පවසති. කාබනික පොහොර භාවිතා කරමින් නියමිත පරතරයට පැල සිටුවීම මගින් බඩඉරිඟු වැඩි අස්වැන්නක් ද ලබා ගත හැකි වේ. (බඩඉරිඟු වගාව පිළිබඳ වෙනම ලිපියක් මෙම සඟරාවේ වෙනත් ස්ථානයක පළ වේ.)

බහුලව වගා කරන ප්‍රභේද ලෙස 'රුවන්' හා 'භද්‍රා' නම් කළ හැකිය. අක්කරයට පැල 20,000ක් පමණ අවශ්‍ය වන අතර බීජ කිලෝ ග්‍රෑම් 08කින් පමණ මෙය ලබා ගත හැකි බව ගොවීහු පවසති. මේවා නියමිත වේලාවට හා ක්‍රමවත්ව බෙද හැරීම නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මෙන්ම සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය හරහා සිදුවෙමින් පවතී. හෙක්ටයාර් එකකින් කිලෝ 3,500ක් පමණ නිෂ්පාදනයක් ලබා ගත හැකි බව බොහොමයක් ගොවි මහතුන්ගේ අදහසයි. මෙවර හෙක්ටයාර් 3,000 සිට 4,500 දක්වා වගා බිම් ප්‍රමාණය වැඩි කිරීමට ඉලක්ක ලබා දී ඇති අතර බඩඉරිඟු වගාව මෙන්ම අනෙකුත් වගා බිම් ද වැඩි කිරීම සඳහා රූපවාහිනිය වැනි මාධ්‍යයන් මගින් ලැබුණු ප්‍රචාරය ද සැළකිය යුතු මට්ටමක පවතී.

## 04. මිරිස් වගාව

දිස්ත්‍රික්කයේ වැඩිපුර වගා කරන ප්‍රභේදය එම්.අයි. 02 වන අතර එම්.අයි 01, **'අරුණළු'** හා **'ඉන්දිරා'** යන ප්‍රභේදයන් ද සුළු වශයෙන් වගා කරනු ලැබේ. කන්නයක දී සාමාන්‍යයෙන් හෙක්ටයාර් 150ක් පමණ වගා කරන අතර **'අපි වවමු-රට නගමු'** වැඩසටහන යටතේ වගා ඉලක්කය හෙක්ටයාර් 300 දක්වා වැඩි කිරීමට සැලසුම් කොට ඇත. මේ වනවිට, එහි ප්‍රගතිය හෙක්ටයාර් 265ක් ලෙස වාර්තා වේ. බීජ අලෙවිය වෙනදට වඩා තුන් ගුණයකින් පමණ වැඩි වී තිබේ. හෙක්ටයාර් එකකට මෙට්‍රික් ටොන් 2ක පමණ අමු මිරිස් නිෂ්පාදනයක් ලබා ගත හැකි බවට උපදෙස් දී ඇති අතර දනට හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 1.5 ත් 2ත් අතර ප්‍රමාණයක් ලබා ගත හැකිව තිබේ.

## 05. ගෙවතු වගාව

**'අපි වවමු-රට නගමු'** වැඩසටහන යටතේ කැපී පෙනෙන වෙනසක් ගෙවතු වගා ක්ෂේත්‍රය තුළ ඇති වූ බව පෙනී යයි. එසේම, මෙම ගෙවතු වගා තුළ කාබනික පොහොර භාවිතයට විශේෂ තැනක් හිමි වී තිබේ. කාබනික දියර පොහොර ද වැඩි වශයෙන් භාවිතා කරන බව මධ්‍යම කඳවුර, පරගහකැලේ, වාවින්න ආදී ප්‍රදේශ වල කරන ලද ක්ෂේත්‍ර සංචාරයන්හි දී දක්නට ලැබුණි. ඉලක්කය ලෙස ආදර්ශ ගෙවතු 600ක් ලබා දුන්න ද, ආදර්ශ ගෙවතු 1,500 ක් පමණ ගොවි මහතුන් විසින් සකස් කොට පවත්වාගෙන යනු ලබයි.

"අපි වවමු-රට නගමු" වැඩසටහන යටතේ මානසික සුවය මෙන්ම ආර්ථික වාසි ද බොහෝ ඇති බව ගොවීහු පවසති. විශේෂයෙන්ම, කාබනික ගෙවතු පමණක් 413ක් ඇති කිරීමට මෙම වැඩසටහන සමත් වී ඇත. මෙහි දී, ගෙවතු තරඟ ද නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ද ගෙවතු වගා තරඟ පවත්වා තෑගි ලබා දීම සිදු කරයි. එසේම, රූපවාහිනී සංස්ථාව මඟින් පවත්වන ලද ගෙවතු වගා තරඟයේ දී පරගහකැලේ ගොවි මහතෙකු අවසන් වටයට තේරී පත්ව සිටියි.

සාමාන්‍ය ගෙවතු 30,000ක ඉලක්කයක් ලබා දී ඇති අතර ගෙවතු 35,000ක් පමණ අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙමින් පවතී. මෙය සන්සන්දනාත්මකව සැලකිය යුතු සංඛ්‍යාවකි. සූක්ෂම වගා සමාගම් 08ක් ද, කාබනික පොහොර නිෂ්පාදන සමාගම් 1ක් ද, ශුද්ධ ජල පද්ධති 28ක් ද, ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඒවා තවදුරටත් වැඩි දියුණු කිරීමට නිලධාරීන් උනන්දු වන බව ප්‍රදේශයේ සංචාරයන්හි දී නිරීක්ෂණයට ලක් විය. ඊට අමතරව, දල් ගෘහ 5ක් හා කාබනික එළවළු අලෙවිසල් 04ක් ආරම්භ කොට ඇත. මෙවැනි දේශීය නිෂ්පාදන දිරි ගැන්වීමේ කාර්යයන් විශාල ප්‍රමාණයක් අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙමින් පවතින අතර එම දිරිගැන්වීම්, වැඩි දියුණු කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් මෙන්ම මාධ්‍ය මඟින් ලබාදුන් ප්‍රචාරය ද ඉවහල් වූ බව සඳහන් කළ යුතුය.

**එම්.එම්.එස්. රත්නායක මහතා**
**විමර්ශක**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
(නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - අම්පාර)

## මල් ලස්සනයි

වසන්තය
මල් බරයි ........
මේ දවස් හැමදම
ලස්සනයි ........
මගෙ හිතත් - චංචලයි
නුඹ ගැනම හිතන්නට
තැත් කරයි ........
එයට ඉඩ හරින්නට සිතා දෝ
අප්පච්චි,
කඩිමුඩියෙ අම්මගෙ කණට
මොනව දෝ මුමුණමින්
සිනාසෙයි ........
වසන්තයේ හැටි ඔහොමමයි
මට සිතෙයි.
මෙද අස්වැන්නත් සාරයි.
සිත දැන් දැන් කියයි,
මා මෙතෙක් නොකියූ
රහස ........
නුඹේ දෙසවනට කොඳුරන්න ........
එවිට.
නුඹ කිපී - ඔහුට බහ දී
මගෙ හිතත් රිදවයි ද
මට සැකයි ........
ඇත්තටම වසන්තයෙ පිපෙන මල්
ලස්සනයි ........
තෙලුව මල් කඩිනමින්
පරව යයි ........
හැබැයි සුවඳ විතරක්
ඉතිරි වෙයි



**සී.යූ. සේනානායක**